# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 763/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 06/05/2024<br>පැය 0820 |

## මාධ්‍ය නිවේදනය

**01. අපරාධයකට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු ටී 56 ගිනි අවියක්, පතරොම් හා හෙරොයින් සමඟ අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.**

2024.04.16 වන දින මෝදර පොලිස් වසමේදී පුද්ගලයෙකුට තියුණු ආයුධ වලින් පහරදී බරපතල තුවාල සිදුකිරීමේ අපරාධයක් සම්බන්ධව විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනකු හා ඊට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2024.05.05 වන දින මෝදර වෙරළ තීරයේදි සහ රෙඩ්බානාවත්ත ප්‍රදේශයේදී මෝදර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21, 23 සහ 24 වයස්වල පසුවන කිඹුලාඇල, බ්ලූමැන්ඩල් සහ වැල්ලම්පිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම අපරාධය සම්බන්ධව මෝදර වෙරළ තීරයේදි අත්ඩංගුවට ගත් **එක් සැකකරුවෙකු සන්තකයේ හෙරොයින් ග්‍රෑම් 25 මිලිග්‍රෑම් 300 ක් තිබී ඇති අතර එම සැකකරුගෙන් සිදුකළ වැඩිදුර ප්‍රශ්න කිරීමේදී ඔහු තාවකාලිකව පදිංචිව සිටි රාගම ප්‍රදේශයේ පිහිටි නිවසක සඟවා තිබූ ටි 56 වර්ගයේ ගිනි අවියක්, එම පතරොම් ගැබ් 02 ක් හා ටි 56 වර්ගයේ පතරොම් 265 ක් , මිලිමීටර් 09 වර්ගයේ පතරොම් 23 ක් හා යතුරුපැදි දෙකක් අත්අඩංගුවට ගෙන ඇත.** අනෙක් සැකකරු අපරාධය සිදු කිරීමට පැමිණි ත්‍රිරෝද රථයේ රියදුරු ලෙස **සිටිමින්** මෙම අපරාධය සඳහා ආධාර අනුබල දීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු සන්තකයේ තිබී **හෙරොයින් ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 700 ක් සොයාගෙන ඇත.**

මෙම අපරාධය සම්බන්ධව රෙඩ්බානාවත්ත ප්‍රදේශයේ අත්අඩංගුවට ගත් සැකකරු සන්තකයේ තිබී **හෙරොයින් ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 700 ක් සොයාගෙන ඇත.**

මෝදර පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02.** **කේරළ ගංජා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මරදන්කේණී පොලිස් ස්ථානය.**

2024.05.05 වන දින රාත්‍රී කාලයේ මරදන්කේණී පොලිස් වසමේ උඩුත්තුරෙයි ප්‍රදේශයේදී මරදන්කේණී පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර **කේරළ ගංජා කිලෝග්‍රෑම් 13 ග්‍රෑම් 585 ක් සහ කේරළ ගංජා කිලෝග්‍රෑම් 16 ග්‍රෑම් 610 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 35 ක් සහ 36 ක් වන ආලියාවලේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මරදන්කේණී පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරවැව පොලිස් ස්ථානය.**

2024.05.05 වන දින සවස් කාලයේ මොරවැව පොලිස් වසමේ අව්වෙනගර් ප්‍රදේශයේදී මොරවැව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මත්කරල් 30ක් සමඟ සැකකරුවෙකු යතුරුපැදියක් සමග** අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන රොටවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

අත්අඩංගුවට ගත් සැකකරුගේ ගමන් මල්ලේ තිබී විවිධ වර්ගයේ වාහන වලට අයත් මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතිකපත් 18ක්, රක්ෂණ කාඩ්පත් 33ක්, ආදායම් බලපත්‍ර 29ක් සොයා ගෙන ඇත.

මෙම ලේඛණ හා සැකකරු සම්බන්ධයෙන් මොරවැව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**